# ටෙන්ඩර් දැන්වීමයි

## මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

# නාගරික සංවර්ධන අධිකාරිය

**කොළඹ කොටුව පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ බිම් මහලෙහි වාණිජ හා විනෝද කටයුතු මධ්‍යස්ථානයේ A කොටසෙහි පිහිටි සාප්පු වෙන්කර දීම සඳහා වන ටෙන්ඩර් දැන්වීම**

01. සභාපති, ආදායම් ටෙන්ඩර් මණ්ඩලය (ප්‍රධාන) මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මෙමගින් කොළඹ කොටුව පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ බිම් මහලෙහි වාණිජ හා විනෝද කටයුතු මධ්‍යස්ථානයේ A කොටසෙහි, සියලුම අවශ්‍යතාවයන් ගෙන් සමන්විත සාප්පු මාසික කුලිය අවුරුදු 05 කින් පසු සංශෝධනය කිරීමට හැකි වන අයුරින් අවුරුදු 10 ක කාල පරිච්ඡේදයකට වෙන්කර දීමට අර්පනයන් කැඳවනු ලබන අතර, එම සාප්පු කාර්යාල, බැංකු, රෙදිපිළි, ආපනශාලා තේ / කෝපි මධ්‍යස්ථාන සහ නාගරික සංවර්ධන අධිකාරියට පිළිගත හැකි නීත්‍යානුකූල අනෙකුත් කාර්යයන් සඳහා යොදා ගත හැක.

| සාප්පු අංකය | භූමි ප්‍රමාණය | මූලික තැන්පතු (කී මනි) රු. | මාසික පාදක කුලිය | ලංසු බැඳුම්කරය |
|---|---|---|---|---|
| පෙර පැවැති අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ A කොටස | ව. අඩි 3295 | 12,000,00.00 | 420,000.00 | 1,000,000.00 |

02. ටෙන්ඩර් ලියකියවිලි ආපසු නොගෙවන රු. 10,000.00 ගාස්තුවක් රජයේ වැට් සහ එන්බීටී (VAT & NBT) බදු සමග මුදලින් ගෙවීමෙන් පසු 2017.08.21 වැනි දින සිට 2017.09.21 වැනි දින දක්වා පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා **අධ්‍යක්ෂ, ඉඩම් සංවර්ධන හා කළමනාකරණ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 6 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල** වෙතින් ලබාගත හැක.

03. රු. 1,000,000.00 වටිනාකමින් යුත් ලංසු බැඳුම්කරයක්, නාගරික සංවර්ධන අධිකාරියෙහි මුදලින් තැන්පත් කොට ලදු පත ටෙන්ඩර් ලිපිලේඛන සමග අමුණා එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීම **2017 සැප්තැම්බර් මස 22 වැනි දින ප.ව. 2.00 ට** නාගරික සංවර්ධන අධිකාරිය, 6 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ස්ථානයේදී අවසන් වන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ / ඇයගේ බලයලත් නියෝජිතයකුට සහභාගී විය හැක.

05. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් එවිය යුතු ආකාරය ලංසු ලිපි ලේඛනයන්හි සඳහන්ව ඇත.

06. මේ පිළිබඳ වැඩිමනත් විස්තර අධ්‍යක්ෂ, ඉඩම් සංවර්ධන හා කළමනාකාර අංශය, 6 වන මහල, "සෙත්සිරිපාය" බත්තරමුල්ල යන ලිපිනයෙන් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුළදී දුරකථන අංක 0113357363 හෝ 2875916-20 දිගුව 209 ඔස්සේ ලබාගත හැක.

**සභාපති,**
**ආදායම් ටෙන්ඩර් මණ්ඩලය (ප්‍රධාන),**
**මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**6 වන මහල - සෙත්සිරිපාය,**
**බත්තරමුල්ල.**